**ධීවර ත්‍යාග අරමුදල - 2016**

**------------------------------**

ධීවර ත්‍යාග අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ දහවන කොටසේ 59(5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ධීවර ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(4) උප වගන්තිය | තොරතුරු සපයන්නන්හට ත්‍යාග මුදල් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පී/එෆ් 423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04:3 වගන්තිය | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.1,253,095 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,865,239 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.612,144 ක පිරිහීම සඳහා රාජ සන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම රු. 2,499,231 කින් වැඩි වුවද වැටලීම් සඳහා දායක වූ නිළධාරීන්ට දීමනා ගෙවීම් රු.3,111,376 කින් වැඩි වීම විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සහ ජලජ සම්පත් කළමනාකරණය කිරීම, විධිමත් කිරීම, රක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ අරමුණ වේ. පනතේ 59 (3) වගන්තිය අනුව 51 (4) උප වගන්තියේ දක්වා ඇති පරිදි රාජ සන්තක කරන ලද මසුන් හා ධීවර ආම්පන්න විකිණීමෙන් ලැබෙන මුදල්, ධීවර ත්‍යාග අරමුදලට බැර කරනු ලැබේ. පනතෙහි 5 වන වගන්තියෙහි සඳහන් යම් නියෝගයක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වැටලීම් කටයුතු කරන නිළධාරීන් හා තොරතුරු සපයන්නන්ට ත්‍යාග මුදල් ලබාදීම සඳහා මෙම අරමුදල පවත්වා ගෙන යනු ලැබේ.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැටලීම්වලට සහභාගි වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබා දීම අප්‍රමාදව කළ යුතු වුවත් 2014, 2015 හා 2016 වර්ෂවල පිළිවෙලින් නඩු පැවරීම් 271 ක්, 348 ක් හා 488 ක් සිදුකර තිබුණද, 2015 හා 2016 වර්ෂවලදී නඩු පැවරීම් 05 ක් වෙනුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ නිලධාරීන් 64 දෙනෙකුට පමණක් රු.3,826,125 ක ත්‍යාග මුදල් ගෙවා තිබුණි. මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

-----------------------

ධීවර ත්‍යාග අරමුදලට අදාළව අභ්‍යන්තර විගණන පරීක්ෂණ තුළින් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ දෝෂ අවම කර විධිමත් කළමනාකරණ පද්ධතියක් ගොඩනැඟීම සඳහා සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබුණ ද වර්ෂය තුළ දී ත්‍යාග අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | පොත්පත් පවත්වා ගැනීම | වැටලීම් පිළිබඳ තොරතුරු ලේඛනයක් පවත්වා නොමැති බැවින්, 2016 වර්ෂයේ නීතිවිරෝධි ධීවර කටයුතු සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇති වැටලීම් පිළිබඳ අනාවරණය කර ගැනීමට නොහැකි වීම. |
| (ආ) | නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීම | ත්‍යාග මුදල් ගෙවීම් කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයන් සකස් කර නොතිබීම. |